# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමලවීර දිසානායක මහතා විසින්
2017 මැයි මස 26 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 මැයි මස 08 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[181 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එම ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එම ආයතනය හා සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටුවා තිබූ බැවින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් ඒ ආයතනය විසින් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, ඒ ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක ....... දරන ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින්නා වූ සියලු ම තැනැත්තන් ද, මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන ) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද, "ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් හා ඊට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවන ලබන පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වේ:—

(අ) කෘෂි විද්‍යාව හා එය ශ්‍රී ලංකාව තුළ භාවිතය ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම;

(ආ) රටේ ප්‍රගතිය හා සංවර්ධනය උදෙසා කෘෂිකර්මයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම හා රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතනවලට උපදේශක සේවා සැපයීම ;

(ඇ) (i) මුල් සංදේශ හා ඒ සම්බන්ධ සාකච්ඡා සඳහා විනිශ්චය සභාවක් ඇති කිරීම ;

(ii) තොරතුරු කෝෂයක් ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

(iii) කෘෂිකාර්මික වෘත්තියට අදාළ කරුණු පළකිරීම ;

(iv) ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා හිතකර සෑම දෙයක් ම කිරීම,

මඟින් කෘෂිකාර්මික ඥානය ලබා ගැනීම, පතල කිරීම හා හුවමාරු කර ගැනීම ;

(ඈ) කෘෂිකාර්මික අධ්‍යාපනය සෑම මට්ටමකින් ම ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) මුල් කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ඒවාට ධෛර්ය දීම හා ඒවා පෝෂ්‍ය කිරීම;

(ඊ) සාමාජිකත්වයේ විවිධ ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීමේ දී අපේක්ෂකයන්ගේ සුදුසුකම් ඇගයීම;

(උ) ආයතනයේ සාමාජිකත්වයේ සියලු ශ්‍රේණි සඳහා සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම හා පැවැත්වීමට සැලැස්වීම හා එම විභාග සඳහා අධ්‍යාපන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම, සැපයීම හා ඒවා අනුමත කිරීම ;

(ඌ) ආයතනය විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන කෘෂිකර්මයට අදාළ ඩිප්ලෝමා, සහතික හා වෙනත් විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා විභාග පැවැත්වීම හා පැවැත්වීමට සැලැස්වීම හා එම විභාග සඳහා අධ්‍යාපන පාඨමාලා නියම කිරීම, අනුමත කිරීම, සැපයීම හා ඒවා අනුමත කිරීම;

(එ) වෘත්තීය ක්‍රියාකාරකම්වල දී හා සාමාජිකයන්ගේ සාමාන්‍ය හැසිරීම්වල දී උසස් ප්‍රමිතියක් පවත්වා ගෙන යන බවට සහතික වීම ;

(ඒ) රටේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා දායක වූ හා විශේෂ දක්ෂතාවන් දැක්වූ ශ්‍රී ලාංකිකයන් පිළිගැනීම හා ඔවුන්ට ප්‍රදානයන් කිරීම;

(ඔ) වෙනත් විද්‍යාත්මක හා වෘත්තීය සංවිධාන සමග සම්බන්ධීකරණයක් ඇති කිරීම;

(ඕ) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික වෘත්තියේ තරාතිරම වැඩිදියුණු කිරීම ; සහ

(ක) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් යමක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් පියවර ගැනීම.

සංස්ථාවේ පාලක සභාව.

**4.** (අ) මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ ආයතනයේ විධායක කාරක සභාවේ ධුර දැරූ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පාලක සභාව සමන්විත විය යුතු ය. මෙම පාලක සභාව පළමුවන මහා සභා රැස්වීම දක්වා පැවතිය යුතු අතර එම රැස්වීමේ දී අලුත් පාලක සභාවක් පත්කර ගත යුතු ය. එම පළමුවන මහා සභා රැස්වීම මෙම පනත ක්‍රියාත්මක වන දින සිට දින අනූවක් (90) ඇතුළත පැවැත්විය යුතු ය.

(ආ) පාලක සභා ඡන්දය මහා සභා රැස්වීමට සමගාමීව පැවැත්විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනනුකූලව තෝරාපත් කර ගනු ලබන්නා වූ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපති, උපලේකම්, උපදේශක මණ්ඩලයේ සභාපති යන අයගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය. එකී කළමනාකරණ මණ්ඩලයේ ධුර කාලය අවුරුද්දක් විය යුතු ය.

(2) සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, එම කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණ මණ්ඩලයක් තෝරා පත් කර ගන්නා තුරු හෝ නම් කරනු ලබන තුරු ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකත්වය.

**6.** (1) සංස්ථාවේ සාමාජිකයන් සාමාන්‍ය සාමාජිකයන්ගෙන් ද, ආශ්‍රිත සාමාජිකයන්ගෙන් ද, සාමූහික සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය.

(2) සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලසනු ලැබිය හැකි වරප්‍රසාද සහ බැඳීම් සහිතව සාමාන්‍ය සාමාජිකයන් හෝ ආශ්‍රිත සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට සුදුසුකම් නොලත් යම් වර්ගවල තැනැත්තන් කළමනාකරණ මණ්ඩලය විසින් සංස්ථාවේ සාමූහික සමාජිකයන් ලෙස බඳවා ගනු ලැබිය හැකි ය.

(3) ආශ්‍රිත සාමාජිකයන් සහ සාමූහික සාමාජිකයන් සඳහා වෙන ම ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර, ඔවුන් විසින් සාමාන්‍ය සාමාජිකයන් මෙන් වරප්‍රසාද භුක්ති විඳිය හැකි නමුත් සංස්ථාවේ රැස්වීම්වල දී ඡන්දය දීමට සුදුසුකම් නොතිබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජිකත්වයෙන් නෙරපීම සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සම්බන්ධයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කලට සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාව විසින් සාදන ලද රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ලෙසට වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

*ආයතනය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.*

**8.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පොරාතුව ම වූ දිනයේ දී පැවැති ආයතනයේ සියලු ණය සහ බැරකම් මෙමඟින් සංස්ථාපිත සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට ආයතනයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.*

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්පත් කර ගැනීමට හෝ සදාකාලයට හෝ යම් ප්‍රකාශිත භාගයකට හෝ වෙනත් නියමයකට යටත් ව යම් අඩු කාලසීමාවකට එය දැරීමට හෝ භුක්ති විඳීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තව ද, එවැනි සියලු ම දේපල මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත් ව යම් නිශ්චල දේපලක් තුළ යම් ගොඩනැගිල්ලක් සෑදීමේ, ඒ දේපල උකස් කිරිමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

*සංස්ථාවේ අරමුදල්*

**10.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපල පුනරුත්ථාපනය කිරීම හෝ සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා යම් අගය ක්ෂය වීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවිය යුතු ය.

*සංස්ථාවේ ගිණුම්.*

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම සහ වියදම ද, වත්කම් හා බැරකම් සහ අනෙක් සියලු ම ගනුදෙනු පිළිබඳ ව නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සංස්ථාව කටයුතු කළ යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය.

නිලධාරීන් ඉවත් කිරීම.

**12.** (1) ආයතනයේ නිලධාරී මණ්ඩලයට හෝ කමිටුවට පත් කර ගනු ලැබූ ඕනෑම කෙනකු මහා සභාවෙන් යෝජනා සම්මත කර ගැනීමෙන් ඒ නිලතලවලින් ඉවත් කළ හැකි ය.

(2) කළමනාකරණ මණ්ඩලයේ වැඩි දෙනකුගේ තීරණයකින් නිලධාරියකුගේ නිලය තාවාකාලිකව අත්හිටුවිය හැකි ය. එම අත්හිටුවීම ඊළඟට එළඹෙන මහා සභාවට ඉදිරිපත් කොට අනුමත කරවා ගත යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

**13.** යම් අවස්ථාවක විසුරුවා හැරීම සිදුවුවහොත් සංස්ථාව විසින් ගෙවිය යුතු සියලු නීත්‍යානුකූල බැරකම් ගෙවීමෙන් පසුව ඉතිරි වන අරමුදල් හා වත්කම් ශ්‍රී ලංකාවේ පිහිටි සුභසාධක ආයතනවලට, මහා සභාවේ එකඟත්වය මත පවරා දිය හැකි ය. එසේ යම් කිසි අවස්ථාවක දී විසුරුවා හැරීමට සිදුවුවහොත් එසේ කළ හැක්කේ දින 14 ක් කලින් ලබන දැන්වීමකින් සාමාජිකත්වය කැඳවා මහා සභාව විසින් ගනු ලබන තීරණය මත ය.

සංස්ථාවේ මුද්‍රාව.

**14.** සංස්ථාවේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ කළමනාකරණ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.